# ශික්ෂණ රෝහල,පේරාදෙණිය.

## <u>ටෙන්ඩර්පත් ලියවිලි</u>

## විදුලි ජනක යන්ත්‍ර නඩත්තු හා සේවා කටයුතු -2026/2027

- ටෙන්ඩර් අයදුම්පත
- ටෙන්ඩර් කොන්දේසි හා සේවා කොන්දේසි
- ශිවිසුම් පත්‍රය

**අනු පිටපත**

ප්‍රාදේශිය ප්‍රසම්පාදන මණ්ඩලය,
ශික්ෂණ රෝහල,
පේරාදෙණිය.

දුරකථන අංකය - 081 2388001

ෆැක්ස් අංකය - 081 2388371

රෝහල ශික්ෂණ පේරාදෙණිය

**විදුලි ජනක යන්ත්‍රය (1000 kVA) නඩත්තු හා සේවා කිරීම-2026/ 2027**

**01.**<u>ටෙන්ඩර්පත් ලබාගැනීමට අවශ්‍ය සුදුසුකම්</u>

1.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.

1.2 රෝහලක විදුලි නඩත්තු කටයුතු සාර්ථකව ඉටු කළ බවට පළපුරුදු සහතිකය හා /හෝ පිළිගත් පුද්ගලික ආයතනයක වසර ක 02 හෝර්ට වැඩි කාලයක් විදුලි නඩත්තු කටයුතු සාර්ථකව ඉටු කිරීම සම්බන්ධයෙන් පළපුරුද්දක් තිබීම.

1.3 ඉදිකිරීම් සංවර්ධන ආයතනයේ වලංගු ලියාපදිංචිය (EM-4) හා ලියාපදිංචියට විදුලි ජනක යන්ත්‍ර සේවය ඇතුලත්විය යුතුය (CIDA EM-4Generators (Gen)

- වංචනික ලියවිලි ඉදිරිපත් කර හෝ වෙනත් ක්‍රියාවක් නිසා අසාදු ලේඛනගතකර ඇති කොන්ත්‍රාත්කරුවන්ට මේ සඳහා ලංසු ඉදිරිපත් කළ නොහැක.

❖ ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම සඳහා යන්ත්‍ර පරීක්ෂා කිරීමට සතියේ දිනයන්හිදී පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා හැකියාව ඇත.

**02) ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීම.**

2.1 සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය.එහි මුල් පිටපත හා අනුපිටපත ලෙස වෙන වෙනම කවර දෙකක බහා , ආරක්ෂිත මුද්‍රා තැබූ එක් කවරයක ඇතුලත්කළ යුතු අතර එම කවරයේ ඉහල කෙලවරේ “ විදුලි ජනක යන්ත්‍ර නඩත්තු හා සේවා 2026/2027” යනුවෙන් සඳහන් කර ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියුම් කවරයේ දැක්විය යුතුය. ටෙන්ඩර් පත්‍රය සකස් කිරීම හා භාරදීම සම්බන්ධ සියලුම වියදම් ටෙන්ඩර්කරු විසින් දැරිය යුතු අතර ඒ පිළිබඳව පේරදෙණිය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂකගේ කිසිදු වගකීමක් හෝ බැදීමක් නැත.

<u>මිළ ගණන් සමඟ ඉදිරිපත්කල යුතු ලේඛණ</u>

- (CIDA EM-4Generators (Gen) ලියාපදිංචි සහතිකයේ කිරීමේ ලිපියේ පිටපත්
- අදාල ක්ෂේත්‍රයේ සේවා සැපයීම් සම්බන්ධ ආසන්න වසර කීපයක් සේවා පලපුරුදු සහතික පිටපත්
- සේවා කටයුතු සඳහා යොදා ගන්නා සේවකයන් හා ඉංජිනේරුවරුන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහතික පිටපත්
- VAT බදු ලියාපදිංචි සහතිකයේ පිටපත්
- වෙනත් අත්‍යාවශ්‍ය සහතික පිටපත්

2.2 ඉහත දක්වා ඇති පරිදි මුද්‍රා තැබූ ටෙන්ඩර්පත් 2026.08.14 දින පෙ.ව. 10.30 ට පෙර ලැබෙන සේ සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය, ශික්ෂණ රෝහල, පේරාදෙණිය ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ රෝහලේ ගණකාධිකාරී කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනැවිත් බහාලීම හෝ කළ හැකි අතර ටෙන්ඩර් භාරගැනීම අවසන්වූ විගස ටෙන්ඩර් විවෘත කිරීමේ කටයුතු කමිටුව ඉදිරියේ දී විවෘත කරනු ලැබේ .

2.1 ටෙන්ඩර් පෝරමය සම්පූර්ණ කිරීමේදී,එහි වෙන්කර ඇති කොටස ප්‍රමාණවත් නොවේ නම් ඊට අදාල විස්තර අමතර ලියවිල්ලක් ලෙස ඉදිරිපත් කල හැක. එසේ ඉදිරිපත් කරන සියළුම අමතර ලියවිලිවල කොන්ත්‍රාත්කරුගේ අත්සන යොදා නිල මුද්‍රාව තැබිය යුතුය.

2.2 ටෙන්ඩර් භාර ගැනීමෙන් අවසන් වේලාවෙන් පසු ලැබෙන සියළුම ටෙන්ඩර් පත්‍රිකා කිසිදු ඇනුම් දිමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.3 ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසන් වේලාව පසුවූ වහාම ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයකුට එම අවස්ථාවේදී සහභාගී විය හැකිය.

2.4 ටෙන්ඩර්පත් විවෘත කිරීමට පත්කල කමිටුවක් විසින් ටෙන්ඩර්පත් විවෘත කරනු ලබන අතර ඒ ඒ ටෙන්ඩර් කරුවන්ගේ මිල ගණන් හා එක් එක් ටෙන්කරුවන්ගේ කරුවන්ගේ නම හා ලිපිනයන් හා ලංසු ඇපකර එවා ඇති නැති බව ප්‍රකාශයට පත් කරනු ලැබේ. තාක්ෂණික තොරතුරු හා අනෙක් විස්තර හෙලිදරව් කරනු නොලැබේ.

**03. <u>ප්‍රසම්පාදන ගාස්තු</u>**

ප්‍රසම්පාදන අයදුම්පත් ගාස්තු ලබා ගැනීම සඳහා රු.2,500.00 ක ආපසු නොගෙවන මුදලක් අධ්‍යක්ෂ මහ රෝහල පේරාදෙණිය වෙත ගෙවා ලබා ගත් කුවිතාන්සියක් අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතුය

**04.ලංසු සුරක්ෂණය (රු. 120,000.00)**

මහ රෝහල වෙත ගෙවා ලබා ගත් රිසිට්පතක් හෝ රජයේ අනුමත බැංකුවකින් දින 90 වලංගුවන " අධ්‍යක්ෂ මහ රෝහල පේරාදෙණිය" නමින් නිකුත්කල ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතුය . සුරක්ෂණය නිදහස් කරනුයේ සියලුම ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමෙන් පසුවය.

**05.කාර්ය සාධන සුරක්ෂණය**

වාර්ෂික කොන්ත්‍රාත් වටිනාකමින් 10% ක මුදලක් කාර්ය සාධන සුරක්ෂණය වශයෙන් රජයේ අනුමත බැංකුවකින් අදාල ගිවිසුමට එළඹීමට පෙර රෝහල් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කල යුතුය.

05.1 විදුලි ජනක යන්ත්‍රයට අයත් සියළුම උපාංග සේවා කිරීම ගිවිසුමට ඇතුලත් වේ. සම්පූර්ණ සේවා වාර 02 ක් සිදු කල යුතු අතර, හදිසි සේවා කැඳවීමකදී පැය 04 ක් ඇතුලත සේවයට පැමිණිය යුතුවේ.

05.2 සේවා හා නඩත්තු කටයුතු නිසි වේලාවට සිදුකර සියලුම යන්ත්‍ර මනා ක්‍රියාකාරී තත්වයෙන් පවත්වාගෙන යා යුතුය .

05.3 විදුලි ජනක යන්ත්‍ර සේවා හා නඩත්තු කටයුතු සඳහා සුදුසුකම් හා පළපුරුදු ඇති සේවකයින් යෙදවිය යුතුය(අවශ්‍ය තාක්ෂණික පළපුරුද්ද තිබිය යුතුය)

05.4 විදුලි ජනක යන්ත්‍රය වාර්ෂිකව සේවා කිරීමේදී ඊට අදාල උපකරණ කොන්ත්‍රාත්කරු විසින් රැගෙන සවිකල යුතු අතර, ගලවා ඉවත් කරන ලද උපකරණ රෝහල් අධ්‍යක්ෂ වෙත ලිඛිතව භාරදිය යුතුය -(Oil filters, Full filters , Coolant filters, Lube Oil ආදිය)

05.5 මෙම ගිවිසුමට අදාල නොවන විදුලි ජනක පද්ධතිය හා සම්බන්ධ අමතර උපකරණවල දෝෂ ඇත්නම් ඒවා නිසිලෙස රැගෙන සවිකිරීම සඳහා යන වියදම් වාර්තාවක් රෝහල් අධ්‍යක්ෂ වෙත ලිඛිතව භාරදිය යුතු අතර වේ

05.6යන්ත්‍ර අලුත්වැඩියාවන් සිදු කිරීමේදී හා අමතර කොටස් යෙදීමේදි යන්ත්‍ර වර්ගයෙන් නියම අමතර කොටස් (original Parts) සපයා සවි කළ යුතුය.

05.7සේවය කඩ කිරීම්, හදිසි තත්වයන් යටතේ නොපමාව ක්‍රියා නොකිරීම, අසතුටුදායක සේවා සැපයීම සම්බන්ධ වාර්තාවීම් සඳහා කොන්ත්‍රාත් වටිනාකමෙන් දඩ මුදල් අයකිරීමට රෝහල් අධ්‍යක්ෂට බලය ඇත.

05.8සේවා හෝ අළුත්වැඩියාවෙන් පසු වැඩබිම සම්පූර්ණයෙන් පිරිසිදු කල යුතුවේ. භාරදියයුතු තත්වයේ ද්‍රව්‍ය රෝහල් පරිපාලනයට ලිඛිතව භාරදිය යුතුවේ.

05.9ගෙවීම් කටයුතු සේවාවට පසුව සිදුකරන අතර ඒ සඳහා නියමිත කාලයට බිල්පත හා සේවා කිරීමට අදාල තාක්ෂණික වාර්තා ඉදිරිපත් කල යුතුවේ

05.10 ඔබ ආයතනය විසින් නඩත්තු හා සේවාවන් සඳහා යොදවනු ලබන සේවකයන්, යන්ත්‍ර සූත්‍ර හෝ වාහන මඟින් පේරාදෙණිය මහ රෝහලේ හා ඊට අනුබද්ධ ආයතන/ඒකකවල ඇති රජයට අදාලවන චංචල හා නිශ්චල දේපල සඳහා යම් අලාභයක් සිදුවී ඇති බව අනාවරණයවීම අනුව එම සියළු අලාභය සඳහා යන වියදම් රජයේ මුදල් රෙගුලාසි අනුව ඔබ ආයතනය විසින් රජයට ගෙවිය යුතුවේ

05.11 මෙම ගිවිසුම කිසිදු උප කොන්ත්‍රාත්කරුවෙකුට පැවරීම කල නොහැකි අතර එසේ කිරීම ගිවිසුම අවලංගු වීමට හේතු වේ.

**05.12 සේවා සැපයීම සම්බන්ධව නිරන්තර පැමිණිලි ලැබීම, අසතුටුදායක සේවා සැපයීම හෝ වෙනත් හේතු මත තවදුරටත් ඔබ ආයතනයේ සේවය තවදුරටත් අවශ්‍ය නොවන බව තහවුරු වීමකදී ලිඛිත දැන්වීමකින් සේවා ගිවිසුම අවසන්කිරීමට රෝහල් අධ්‍යක්ෂ වෙත බලය ඇත**

## 06. ගෙවීම් සම්බන්ධ කොන්දේසි

කාර්යය විධිමත් පරිදි සතුටුදායක අනුදමින් නිමකර ඇති බව තහවුරු කර ගැනිමෙන් පසු ගිවිසුම්ප්‍රකාරව ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ

## 07. රක්ෂණය

අවසන් හානි වගකීම් සහතිකය ( last defects liability certificate) නිකුත් කිරීමට පෙර එම කොන්ත්‍රාත්කරු නිසා තෙවන පාර්ශ්වය සඳහා සිදුවන කිසියම් මරණයක් ,පුද්ගල අනතුරක්, භෞතික දේපලකට සිදුවන හානියක් හෝ නැතිවීමක් සඳහා රක්ෂණය කිරීම කොන්ත්‍රාත්කරු විසින් සිදුකල යුතුය.

කොන්ත්‍රාත්කරු විසින් ඔහුගේ වත්කම් රක්ෂණය කර එය පවත්වාගෙන යා යුතු අතර කිසියම් කාර්යයක් හේතුවෙන් කොන්ත්‍රාත්කරු යොදවා ඇති සේවකයින්ට සිදුවන මරණ හෝ අනතුරු හෝ හානි සඳහා වියදම් හා වන්දි ගෙවීම් වලින් දෙපාර්තමේන්තුව හා රෝහල් අධ්‍යක්ෂ නිදහස් වේ.

සේවක භාර අරමුදල් , ඇතුළු කිසියම් පාර්ලිමේන්තු පනතකින් හෝ ව්‍යවස්ථානුකූල විධිවිධාන යටතේ කොන්ත්‍රාත්කරුගේ සේවකයින් කරනු ලබන හිමිකම් සඳහා වන්දි වලින් දෙපාර්තමේන්තුව හා රෝහල් අධ්‍යක්ෂ නිදහස් වේ.

මෙම ටෙන්ඩරයට අදාල වන පිළිබඳව වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය වන්නේ නම් පූර්ව දැනුම් දීමකින් අනතුරුව පහත සඳහන් දුරකථන අංක වලින් විමසිය හැකිය.

දුරකථන අංක -0812388001 ෆැක්ස් අංකය -0812388371

අධ්‍යක්ෂ,
ශික්ෂණ රෝහල,
පේරාදෙණිය.

**<u>රෝහල ශික්ෂණ පේරාදෙණිය</u>**

**<u>විදුලි ජනක යන්ත්‍රය (1000 kVA) නඩත්තු හා සේවා කිරීම- 2026/ 2027</u>**

පේරාදෙණිය මහ රෝහලේ 1000 kVA විදුලි ජනක යන්ත්‍ර නඩත්තු හා සේවා කටයුතු ඉටුකිරීමට අදාලවදක්වා ඇති සියලුම කොන්දේසි හා උපදෙස් වලට යටත්ව නඩත්තු හා සේවා කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කරමි.

01. ආයතනයේ නම :- ...........................................................................................
02. ලිපිනය :- ...........................................................................................
...........................................................................................
03. දුරකතන අංකය :-ස්ථාවර :- ......................................ජංගම :-..........................
ෆැක්ස් :- ....................................... විද්‍යුත් තැපෑල :- ..........................................
04. ලංසු සුරක්ෂණය
i.බැංකුව හා ශාඛාව:-...........................................................................................
ii.රෝහල් සරප් වෙත මුදලින් ගෙවා ඇත්නම් රිසිට්පත් අංකය:-..............................

CIDA ලියාපදිංචිඅංකය :- ............................................

**යෝග්‍යතාවය- EM 5 (Generators) හෝ ඉහල** ලියාපදිංචි අංකය වැට් බදු අංකය :--

05. පූර්ව ආසන්න වසර 05ක සේවා පළපුරුද්ද-
..........................................................................................................
.....
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
....................................
06. ඉදිරිපත් කරන වාර්ෂික මිල-
- ❖ වැට් රහිත මිල- රු. .............................................
- ❖ වැට්මුදල <u>රු. .............................................</u>
- ❖ වැට් සහිත මිල- <u>රු. .............................................</u>

- ❖ මිල අකුරෙන්- රුපියල් ....................................................................
..........................................................................................
මිළ අකුරෙන් ( VAT සහිත) ..............................................................

➢ **<u>සේවා වාර දෙක සඳහා (වර්ෂයකට) යන අයිතමයන්හි විස්තරාත්මක වාර්තාවක් මිළ ගණන් සහිතව ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.</u>**

දිනය- .......................................... ..................................................

කොන්ත්‍රාත්කරුගේ අත්සන

(නිල මුද්‍රාව)

<u>රෝහල ශික්ෂණ පේරාදෙණිය</u>

# <u>විදුලි ජනක යන්ත්‍රය (72 kVA) නඩත්තු හා සේවා කිරීම-2026/ 2027</u>

පේරාදෙණිය මහ රෝහලේ 72 kVA විදුලි ජනක යන්ත්‍ර නඩත්තු හා සේවා කටයුතු ඉටුකිරීමට අදාලවදක්වා ඇති සියලුම කොන්දේසි හා උපදෙස් වලට යටත්ව නඩත්තු හා සේවා කිරීම සඳහා මිල ගණන් ඉදිරිපත් කරමි.

01. ආයතනයේ නම :- ................................................................................................

02. ලිපිනය :- ................................................................................................
………………………………………………………………………………………………

03. දුරකතන අංකය :-ස්ථාවර :- ......................................ජංගම :-..........................
ෆැක්ස් :- ....................................... විද්‍යුත් තැපැල :- ...........................................

04. ලංසු සුරක්ෂණය
i.බැංකුව හා ශාඛාව:-.........................................................................................
ii.රෝහල් සරප් වෙත මුදලින් ගෙවා ඇත්නම් රිසිට්පත් අංකය:-..............................

CIDA ලියාපදිංචිඅංකය :- ............................................
**යෝග්‍යතාවය- EM 4 (Generators) හෝ ඉහල** ලියාපදිංචි අංකය වැට් බදු අංකය :--

05. පූර්ව ආසන්න වසර 05ක සේවා පළපුරුද්ද-
.....................................................................................................................................
.....
.....................................................................................................................................
.....................................................................................................................................
.....................................................................................................................................
...................................

06. ඉදිරිපත් කරන වාර්ෂික මිල-

- වැට් රහිත මිල- රු. ............................................
- වැට්මුදල <u>රු. ............................................</u>
- වැට් සහිත මිල- <u>රු. ............................................</u>

- මිල අකුරෙන්- රුපියල් ...................................................................
.......................................................................................................
මිළ අකුරෙන් ( VAT සහිත) ............................................................

➢ **<u>සේවා වාර දෙක සඳහා (වර්ෂයකට) යන අයිතමයන්හි විස්තරාත්මක වාර්තාවක් මිළ ගණන් සහිතව ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.</u>**

දිනය- .......................................... ...................................................

කොන්ත්‍රාත්කරුගේ අත්සන

(නිල මුද්‍රාව)